# 2026 NAPLAN (නැප්ලෑන්)
# තනි පුද්ගල ශිෂ්‍ය වාර්තාව
## දෙමාපියන් හා රැකබලා ගන්නන් සඳහා තොරතුරු



NAPLAN යනු 3, 5, 7 සහ 9 වසරවල සිසුන් සිටින සාක්ෂරතාව හා ගණිත හැකියාව පිළිබඳව ජාතික මට්ටමෙන් කෙරෙන ඇගයීමකි. සියලුම ඕස්ට්‍රේලියානු සිසුන්ට පෙනී සිටීම සඳහා අවස්ථාව ලැබෙන එකම ජාතික තක්සේරුව එයයි. සාක්ෂරතාව හා ගණිත හැකියාව පිළිබඳ කුසලතා සියලු ඉගෙනුම් සහ සමාජයට ඵලදායී ලෙස සහභාගී වීමේ හැකියාව සඳහා තීරණාත්මක පදනම වේ. NAPLAN ප්‍රශ්න මගින් ඕස්ට්‍රේලියානු ඉංග්‍රීසි සහ ගණිත විෂය මාලාව සමඟ අනුකූල අන්තර්ගතය ඇගැයීමට ලක් කරයි.

NAPLAN පරීක්ෂණ යනු පාසලේ ඇගයුම් සහ වාර්තා කිරීමේ ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. එම පරීක්ෂණ සෑම ශිෂ්‍යයෙකු සඳහාම වසර 2කට වරක් පවත්වනු ලබන බැවින්, ඒවා මගින් ශිෂ්‍ය කාර්ය සාධනය පිළිබඳව ගුරුවරුන් විසින් සිදුකරන ලද පුළුල්, අඛණ්ඩ ඇගයීම් ප්‍රතිස්ථාපනය කිරීමට නොහැකිය. ඔබේ දරුවාගේ අධ්‍යාපනික ප්‍රගතිය පිළිබඳ හොඳම අවබෝධය ඔබේ දරුවාගේ ගුරුවරයාට තිබෙනු ඇත. අනෙකුත් පාසල් ඇගයීම් වාර්තා සමගින්, ඔබේ දරුවාගේ ප්‍රගතිය ඔවුන්ගේ ගුරුවරයා සමඟ සාකච්ඡා කිරීම සඳහා NAPLAN තනි පුද්ගල ශිෂ්‍ය වාර්තා භාවිතා කළ හැකිය.

## NAPLAN මගින් සිසුන් ඇගැයීමට ලක් කරන්නේ කෙසේද?

සෑම වසරකම මාර්තු මාසයේදී, NAPLAN පරීක්ෂණ ඕස්ට්‍රේලියාව පුරා පාසල්වලට මාර්ගගතව ලබා දෙයි. මාර්ගගත ඇගැයීම මගින් එක් එක් සිසුවෙකුගේ ප්‍රතිචාර වලට ගැලපෙන ප්‍රශ්න ඉදිරිපත් කරයි. එමගින් වඩාත් නිවැරදි ප්‍රතිඵල සහ වඩාත් ප්‍රසන්න පරීක්ෂණ අත්දැකීමක් සිසුන් සඳහා ලබා දෙයි.

NAPLAN හි ප්‍රශ්න බොහෝ දුරට පදනම් වී ඇත්තේ සිසුන් පෙර වසරවල පාසල් අධ්‍යාපනයෙන් ඉගෙන ගත් සාක්ෂරතා හා ගණිත හැකියා කුසලතා මත ය. ප්‍රශ්න කිහිපයක් මගින් පරීක්ෂණය කරන වසරේ හා ඊළඟ වසරේ අන්තර්ගතයන් ඇගැයීමට ලක් කරයි. මෙම ප්‍රශ්න සැලසුම් කර ඇත්තේ සිසුන් පෙර වසරවල දී ඉගෙන ගත් උපාය මාර්ග භාවිතයෙන් ඒවාට පිළිතුරු සැපයීමට හැකිවන පරිදි ය. සියලුම හැකියාවන් ඇති සිසුන්ට තමන්ට කළ හකි දේ පෙන්වීමට හැකි බව මෙයින් සහතික කරයි.

NAPLAN මගින් මනිනු ලබන දැනුම සහ කුසලතා පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු www.nap.edu.au වෙතින් ලබාගත හැකිය.

## ප්‍රවීණතා ප්‍රමිතීන්

ශිෂ්‍ය සාධන මට්ටම පිළිබඳ පැහැදිලි තොරතුරු සපයන ප්‍රවීණතා ප්‍රමිතීන්ට එරෙහිව NAPLAN ප්‍රතිඵල වාර්තා කරයි. මෙම ප්‍රමිතීන් ප්‍රධාන වශයෙන් පාසල් අධ්‍යාපනයේ පෙර වසරවල ඉගැන්වූ දේ මත පදනම්ව, NAPLAN පරීක්ෂණ අවස්ථාවේදී ශිෂ්‍යයා වෙනුවෙන් බලාපොරොත්තු වන අභියෝගාත්මක නමුත් සාධාරණ මට්ටමකට සරිලන පරිදි සකස් කර ඇත.

ප්‍රවීණතා ප්‍රමිතීන්ට ප්‍රවීණතා මට්ටම් ඇතුළත් වේ:

- **අති විශිෂ්ට:** ශිෂ්‍යයාගේ ප්‍රතිඵලය පරීක්ෂණ පවත්වන අවස්ථාවේ බලාපොරොත්තු ඉක්මවයි.
- **ප්‍රබල:** ශිෂ්‍යයාගේ ප්‍රතිඵලය පරීක්ෂණය අවස්ථාවේ පැවති අභියෝගාත්මක නමුත් සාධාරණ අපේක්ෂාවන් සපුරාලයි.
- **සංවර්ධනය වෙමින්:** ශිෂ්‍යයාගේ ප්‍රතිඵලය මගින් පෙන්නුම් කරන්නේ පරීක්ෂණ අවස්ථාවේ පැවති අපේක්ෂාවන් කරා ශිෂ්‍යයා වැඩ කරමින් සිටින බවයි.
- **අමතර සහාය අවශ්‍යයි:** ශිෂ්‍යයාගේ ප්‍රතිඵලය මගින් පෙන්නුම් කරන්නේ පරීක්ෂණ අවස්ථාවේ අපේක්ෂා කළ ඉගෙනුම් ප්‍රතිඵල ඔවුන්ට අත්කර ගැනීමට නොහැකි වී ඇති බවයි. සතුටුදායක ලෙස ප්‍රගතිය ළඟාකර ගැනීම සඳහා ඔවුන්ට අමතර සහාය අවශ්‍ය වීමට ඉඩ ඇත.

තනි පුද්ගල ශිෂ්‍ය වාර්තාවේ 4 වැනි පිටුවේ සිසුන් දන්නා දේ හා එක් එක් ප්‍රවීණතා මට්ටම් තුළ කළ හැකි දේ පිළිබඳ වඩාත් සවිස්තරාත්මක සාරාංශයක් සපයයි. වැඩිදුර තොරතුරු www.nap.edu.au වෙතින් ලබාගත හැකිය.

## ප්‍රවීණතා මට්ටම් තීරණය කළේ කෙසේද?

එක් එක් ඇගයීම් ක්ෂේත්‍රය හා වසර මට්ටම සඳහා ඉගෙනීමේ අපේක්ෂාවන්ට එරෙහිව ප්‍රවීණ ගුරුවරුන්ගේ පැනලයක් විසින් ප්‍රවීණතා මට්ටම් හඳුනා ගන්නා ලදී. කේන්ද්‍රගත කණ්ඩායම් හා ජාතික දෙමාපිය සංවිධාන හරහා ශිෂ්‍ය වාර්තා පිළිබඳ දෙමාපියගේ හා රැකබලා ගන්නන්ගේ යෙදවුම ද සපයන ලදී.

## NAPLAN වාර්තාව කියවීම

NAPLAN වාර්තාව මගින් එක් එක් ඇගයීම් ක්ෂේත්‍රය (ගණිත හැකියාව, කියවීම, ලිවීම, අක්ෂර වින්‍යාසය හා ව්‍යාකරණ සහ විරාම ලකුණු) සඳහා ප්‍රවීණතා පරිමාණයක් මෙන්ම ශිෂ්‍යයාගේ ප්‍රතිඵලය පරිමාණයේ කළු තිතක් ලෙස පෙන්නුම් කරයි.

වාර්තාව මගින් සෑම දරුවෙකු වෙනුවෙන් වසර සඳහා ජාතික සාමාන්‍යයට එරෙහිව ඔවුන්ගේ සාධනය (කළු ත්‍රිකෝණයක් ලෙස පෙන්වයි) සහ ඔවුන්ගේ වසර සඳහා මැද මට්ටමේ සිසුන්ගෙන් 60% කගේ සාධන පරාසය (ලා පැහැති සෘජුකෝණාස්‍රයක් ලෙස පෙන්වයි) පෙන්නුම් කරයි.

NAPLAN යනු ශිෂ්‍යයෙකුගේ කාර්ය සාධනය පිළිබඳ ප්‍රයෝජනවත් ප්‍රතිවේද ලබා දිය හැකි වටිනා මෙවලමකි. නමුත් තනි පුද්ගල වාර්තා ශිෂ්‍යයාගේ සමස්ත ඉගෙනීම පිළිබඳ පරිපූර්ණ මිනුමක් වීමට වඩා, පරීක්ෂණ දිනයේ ඔවුන්ගේ කාර්ය සාධනය පිළිබිඹු කරන බැවින්, ඒවා ප්‍රවේශමෙන් අර්ථ නිරූපණය කළ යුතුය. සම්බන්ධකතා ගැටළු හේතුවෙන් සමහර සිසුන්ට ලිවීමේ පරීක්ෂණය මාර්ගගතව කරන අතරතුර බාධාවන්ට මුහුණ දුන් බැවින් 2026 වසරේ ලිවීමේ ප්‍රතිඵල සඳහා මෙය වැදගත් වේ. ඔබේ දරුවාගේ අධ්‍යාපන ප්‍රගතිය පිළිබඳ හොඳම ප්‍රතිවේදය ඔබේ දරුවාගේ ගුරුවරයාට තිබෙනු ඇත.



Translation © VCAA

## මගේ දරුවාගේ වාර්තාවේ ඔවුන් පරීක්ෂණය කඩදාසි භාවිතයෙන් සිදු කළ බව සඳහන් වන්නේ නම්, කුමක් කළ යුතුද?

NAPLAN මාර්ගගත පරීක්ෂණයක් වන අතර ශිෂ්‍යයන්ට ඔවුන්ගේ පරීක්ෂණ කඩදාසි භාවිතයෙන් කිරීම සිදුවිය හැකි අවස්ථා සුළු සංඛ්‍යාවක් ඇත. මේවාට පහත දැක්වෙන අවස්ථාවන් ඇතුළත් වේ:

- පාසල්, පිළිගත් විකල්ප විෂය මාලාවක් භාවිතා කරන විට
- ප්‍රවේශ්‍යතා හේතුන් මත සිසුන්ට කඩදාසි භාවිතයෙන් කෙරෙන පරීක්ෂණ අවශ්‍ය වූ විට

3 වසරේ ශිෂ්‍යයෝ සැමවිටම කඩදාසි භාවිතයෙන් කෙරෙන පරීක්ෂණ සම්පූර්ණ කරති.

## මට මගේ දරුවාගේ කාර්ය සාධනය පෙර NAPLAN වාර්තා සමඟ සැසඳිය හැකිද?

2023 වසරේ සිට ඉදිරි ප්‍රතිඵල 2008 සිට 2022 දක්වා ප්‍රතිඵල සමඟ සෘජුව සැසඳිය නොහැක. මෙයට හේතු වන්නේ නව ප්‍රමිතීන්ගෙන් යුත් මාර්ගගත පරීක්ෂණ සඳහා වඩාත් ගැලපෙන නව මිනුම් පරිමාණයක් හඳුන්වා දීම සහ පරීක්ෂණ 2 වැනි වාරයේ සිට 1 වැනි වාරය වෙත මාරු කිරීම ය.

කෙසේ වෙතත්, 2025 වසරේදී නව වාර්තාකරණ විධිවිධානය යටතේ 5, 7 සහ 9 වසරවල සිසුන් NAPLAN චක්‍ර 2ක් දැන් සම්පූර්ණ කර ඇත. මෙයින් අදහස් කරන්නේ දෙමාපියන්ට සහ රැකබලා ගන්නන්ට තම දරුවාගේ ප්‍රවීණතා මට්ටම් සංසන්දනය කිරීම සඳහා 2024 සහ 2026 වසර වලදී ලැබුණු තනි ශිෂ්‍ය වාර්තා භාවිතා කළ හැකි බවය.

2024 සහ 2026 වසර පුරා ශිෂ්‍යයෙකුගේ ප්‍රතිඵල ජාතික සාමාන්‍යය මෙන්ම මැද මට්ටමේ සිසුන්ගෙන් 60% ක් සමඟ සැසඳිය හැකිය.

සිසුන් NAPLAN වසර හරහා ගමන් කරන විට, එක් එක් ප්‍රවීණතා මට්ටම සම්පූරණ කර ගැනීමට අවශ්‍ය වන කුසලතා සහ අවබෝධය සම්බන්ධ දුෂ්කරතා මට්ටම ඉහළ යයි. 3 වසර සහ 5 වසර වැනි අනුප්‍රාප්තික වසරවලදී එකම ප්‍රවීණතා මට්ටමක් ලබා ගන්නා ශිෂ්‍යයෙකු තවමත් ප්‍රගතියක් ලබමින් සිටිය හැකිය.

## NAPLAN මගේ දරුවට උපකාරී වන්නේ කෙසේද?

NAPLAN මගින් දෙමාපියන් හා රැකබලා ගන්නන් හට ඔවුන්ගේ දරුවා සාක්ෂරතාව හා ගණිත හැකියාව සම්බන්ධව ක්‍රියා කර ඇති ආකාරය ගැන දැන ගැනීමට ඉඩ සලසයි. ඔබේ දරුවාගේ සාධනය එම වසරේ සියලුම සිසුන්ගේ ජාතික සාමාන්‍යය සමඟ සහ ප්‍රවීණතා මට්ටම්වලට එරෙහිව සැසඳිය හැකිය.

ප්‍රතිඵල මගින් දෙමාපියන්ට, රැකබලා ගන්නන්ට හා සිසුන්ට එක් එක් ශිෂ්‍ය ප්‍රගතිය ගැන ගුරුවරුන් සමඟ සාකච්ඡා කිරීමට උපකාර විය හැකිය.

## මෙම ප්‍රතිඵල මගේ දරුවාගේ අනාගතය සඳහා අදාළ වන්නේ කෙසේද?

NAPLAN ප්‍රතිඵල මගින් ඔබේ දරුවා තම පාසල් විෂය මාලාව හරහා ඉගෙන ගන්නා සාක්ෂරතා හා ගණිත හැකියා කුසලතා පිළිබඳ වැදගත් තොරතුරු සපයයි. මෙම ප්‍රතිඵල ඔබේ දරුවා පාසැලේදී කරන අනෙකුත් ඇගයීම් කටයුතු වැඩිදියුණු කරයි. එමගින් ඔබට සහ ඔබේ දරුවාගේ ගුරුවරුන්ට මෙම පරීක්ෂණ පවත්වන අවස්ථාවේදී ඔබේ දරුවාගේ සාධනයන් පිළිබඳ අවබෝධයක් ලබා දේ. ඔබේ දරුවාට ඉතාමත්ම හොඳින් කටයුතු කිරීමට උපකාරී වීම සඳහා මෙම තොරතුරු භාවිතා කළ හැකිය.

ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස සමහර පාසල්, පාසල් වාර්තා වලට අමතරව NAPLAN වාර්තා ඉල්ලා සිටිය හැකිය. NAPLAN පාසල් ඇතුළත් වීමේ පරීක්ෂණයක් ලෙස සැලසුම් කර නැත. කෙසේ වෙතත්, මෙම ප්‍රතිඵල ශිෂ්‍යයෙකුගේ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ නව පාසලකට දැනුම් දීම සඳහා ප්‍රයෝජනවත් විය හැකිය.

## NAPLAN මගේ දරුවාගේ පාසලට උපකාරී වන්නේ කෙසේද?

NAPLAN ඕස්ට්‍රේලියාවේ සෑම දරුවෙක්ම පෙනී සිටින ජාතික මට්ටමෙන් පවත්වන එකම ඇගයීම වන්නේය. එය පහත දැක්වෙන දේ සඳහා උපකාරී වේ:

- ගුරුවරුන් හට වැඩි අභියෝගයන් හෝ අමතර උදව් අවශ්‍ය සිසුන් වඩා හොඳින් හඳුනා ගැනීම සඳහා
- පාසල්වලට තම ඉගැන්වීමේ වැඩසටහන්වල ශක්තීන් සහ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා
- පාසල්වලට තම සාක්ෂරතාව හා ගණිත හැකියාව සම්බන්ධ ඉලක්ක සකස්කර ගැනීම සඳහා
- පාසල් පද්ධති මගින් පාසල්වලට පිරිනමන ලද වැඩසටහන් හා සහාය සමාලෝචනය කිරීම සඳහා.

අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක වන ආකාරය හා සිසුන් වැදගත් සාක්ෂරතා සහ ගණිත හැකියා ප්‍රමිතීන් සපුරාලන්නේද යන්න පරීක්ෂා කිරීමට රජයන්ට උපකාර කිරීම සඳහා NAPLAN මගින් ජාතික මට්ටමෙන් සැසඳිය හැකි දත්ත ද සපයයි.

## ප්‍රතිඵල දකින අන් අය කවුරුන් ද?

සෑම වසරකම, පරීක්ෂණ පරිපාලන බලධාරීන් විසින් NAPLAN පරීක්ෂණයට පෙනී සිටින සියලුම සිසුන්ගේ ප්‍රතිඵල පාසල් වෙත ලබා දෙයි. පාසල පුරා වැඩිදියුණු කිරීම් සඳහාඔවුන් යොදා ගන්නා සැලසුම් පිළිබඳව දැනුම් දීම සඳහා මෙම ප්‍රතිඵල භාවිතා කිරීමට පාසල් දිරිමත් කරනු ලැබේ.

තනි පුද්ගල ශිෂ්‍ය වාර්තා රහසිගත වේ. ඔබේ ප්‍රාදේශීය පරීක්ෂණ පරිපාලන අධිකාරිය සහ ඔබේ දරුවාගේ පාසලේ කාර්ය මණ්ඩලය හැර අන් කිසිවකුටත් ඔබේ දරුවාගේ වාර්තාව දැකගැනීමට නොලැබෙනු ඇත.

මාධ්‍යක පාසල් ප්‍රතිඵල, My School හි www.myschool.edu.au ඔස්සේ ප්‍රසිද්ධියේ වාර්තා කෙරේ. එක් එක් වසරේ ප්‍රතිඵල වසර අවසානයේදී වෙබ් අඩවිය මගින් යාවත්කාලීන කරනු ඇත. ඔබේ දරුවාගේ තනි පුද්ගල ප්‍රතිඵල My School වෙතින් ලබාගත නොහැකිය.


Translation © VCAA